# අඟහරුවාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි. ක්‍රියා 7:51−8:1

"ජේසුස් ස්වාමිනි, මාගේ ආත්මය භාර ගත මැනව."

"හිතුවක්කාර මිසදිටු සිත් හා බිහිරි කන් ඇත්තෙනි, ඔබගේ පියවරුන් මෙන් ඔබත් නිතරම ශුද්ධාත්මයාණන්ට එරෙහිව සිටින්නහු ය. ඔබගේ පියවරුන් පීඩා නොකළ දිවැසිවරයෙක් ඇද්ද? ඔව්හු ධාර්මිකයාණන්ගේ ආගමනය කල් තියා දැන්වූ අය මරා දැමූහ. දැන් ඔබ ඒ ධාර්මිකයාණන් පාවා දී මරා දමා ඇත. දේව දූතයන් විසින් දෙන ලද ව්‍යවස්ථා ඔබ ලැබූ නමුත් ඒවා නොපිළිපැද්දහු ය."

ඔව්හු ඒ අසා, ඔහුට විරුද්ධව කෝපයෙන් දිලිහී දත්මිටි කෑහ. එහෙත් ඔහු ශුද්ධාත්මයෙන් පූර්ණව ස්වර්ගයට බැල්ම හෙළා, දෙවියන් වහන්සේගේ තේජශ්‍රීයෙන් උන්හන්සේගේ දකුණු පැත්තේ ජේසුස් වහන්සේ නැඟිට සිටිනවාත් දැක, "අන්න, ස්වර්ගය විවර වී ඇත. මනුෂ්‍ය පුත්‍රයාණන් දෙවියන් වහන්සේගේ දකුණු පස නැඟිට සිටිනවා මට පෙනේ" යයි කීය. එහෙත් ඔව්හු මහත් ශබ්දයෙන් මොර හඬ නගා තමන්ගේ කන් වසාගෙන, එක සිතින් ඔහු පිටට කඩා පැන, ඔහු නුවරින් පිටතට ඇද, ඔහුට ගල් ගැසූහ. සාක්ෂිකාරයෝ තමන්ගේ ඇඳුම් සාවුල් නම් යෞවනයෙකුගේ පාමුල තැබූහ. "ජේසුස් ස්වාමින් වහන්ස, මාගේ ආත්මය පිළිගත මැනැවැ" යි කියා ස්තේපන් යාච්ඤා කරද්දී ඔව්හු ඔහුට ගල් ගැසූහ. ඔහු දණින් වැටී, "ස්වාමින් වහන්ස, මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනැවැ" යි මහත් හඬින් මොර ගසා කීය. මෙසේ කියා ඔහු දිවංගත විය.

ඔහු මරා දැමීම ගැන සාවුල් ද සතුට ප්‍රකාශ කළේය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය **31:2b-3, 5-7,16, 20**

පිළිතුර: සමිඳුනි, ඔබ අතට මාගේ ජීවිතය භාර කරමි.

ගීය: සමිඳුනි, ඔබ මට බලගතු විමුක්ති පර්වතයක් ද
ආරක්ෂක බලකොටුවක් ද වුව මැනව.
ඔබ මාගේ පර්වතය හා බලකොටුවය.
එබැවින් ඔබේ නාමයේ අනුහසින් මට මඟ පෙන්වා
මා ගෙන ගිය මැනව.

ඔබ අතට මාගේ ජීවිතය භාර කරමි.
සත්‍යවාදී දෙවි සමිඳුනි, ඔබ මා මිදූ සේක.
බොරු දෙවි දේවිතාවන් නමදින අයට මම ද්වේශ කරමි.
එහෙත්, මම සමිඳුන් කෙරේ විශ්වාසය තබමි.

ඔබේ කරුණාව ගැන සතුටු වී උදම් අනමි.
ඔබ මාගේ දුක් පීඩා දුටු සේක.
ඔබ මාගේ සිත් වේදනා තේරුම් ගත් සේක.
ඔබ මෙහෙකරු වන මා දෙස කරුණාවෙන් බැලුව මැනව.
ඔබේ තිර පෙමින් මා ගැළෙවුව මැනව.

මිනිසුන්ගේ කුමන්ත්‍රණ වලින් ඔබ ආරක්ෂාවෙහි
ඔබ ඔවුන් සඟවන සේක.
කලහකාරී අයගෙන් ඔවුන් වෙන් කොට ඔබේ මැඳුරෙහි
සුරැකිව තබන සේක. සමිඳුන් හට ප්‍රශංසා වේවා!

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"මම යහපත් බැටළු එඬේරා වෙමි.
මම මාගේ බැටළුවන් අඳුනමි. ඔව්හු ද මා අඳුනති."
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 6:30–35

"ඔබට ස්වර්ගයෙන් ආහාරය දුන්නේ මෝසෙස් නොවේ. ස්වර්ගයෙන් සැබෑ ආහාරය දෙන්නේ මාගේ පියාණන් වහන්සේ ය."

එවිට ඔව්හු, "එසේ නම් අප විසින් දැක අදහා ගන්නා පිණිස ඔබ කවර හාස්කම් දක්වන සේක්ද? අපේ පියවරු පාළුකරයෙහි දී මන්නා කෑහ. 'බුදින පිණිස එතුමෝ ඔවුන්ට ස්වර්ගයෙන් ආහාර සැපයූහ' යි ලියා ඇතැ'යි උන්වහන්සේට කීහ. එවිට ජේසුස් වහන්සේ 'ඒකාන්තයෙන්ම මම ඔබට කියමි. ස්වර්ගයෙන් ඔබට ආහාරය දුන්නේ මෝසෙස් නොවේ. ස්වර්ගයෙන් සැබෑ ආහාරය දෙන්නේ මාගේ පියාණන් වහන්සේ ය. මන්ද, දෙවියන් වහන්සේගේ ආහාරය වනාහි ස්වර්ගයෙන් පහළ වී ලෝකයට ජීවනය දෙන ආහාරය'යි වදාළ සේක. ඔව්හු ද, "ස්වාමිනී, ඒ ආහාරය නිතරම අපට දුන මැනවැ" කීහ.

ජේසුස් වහන්සේ කතා කොට, "ජීවනදායක භෝජනය මම ය, මා වෙත පැමිණෙන යමෙක් වේද, ඔහුට සාගිනි නොවන්නේ ය. මා අදහන යමෙක් වේද, ඔහුට කිසි කලෙකත් පිපාසය නොවන්නේ ය" යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.